විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - (03)
විමලසේන සර් - 2021. 10. 10
**(8.30 – 11.30)**

# චතුර් අධ්‍යාපන දර්ශන



<u>විෂය අන්තර්ගතය</u> :

- සන්තතවාදය
- සාරාත්මවාදය
- ප්‍රගතිවාදය
- ප්‍රතිනිර්මාණවාදය

දාර්ශනිකයා යථාර්ථය නුවණින් කල්පනා කරයි. ඒ සඳහා ඥාන ශක්තිය වර්ධනය විය යුතුය. ඥානය වර්ධනය කර කර ගැනීමේ ප්‍රායෝගික ක්‍රියා මාර්ගය අධ්‍යාපනයයි. මේ අනුව අධ්‍යාපනය හා දර්ශනය අතර පවත්නා සම්බන්ධතාවය එකිනෙකට උපකාරී වන අතර අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට පෝෂණය කරයි. මේ අනුව දාර්ශනික මතවාද ඇසුරින් විෂයමාලාව සැකසීමේදී හඳුනාගෙන ඇති අධ්‍යාපන දර්ශන කිහිපයකි. මේවා **<u>චතුර් අධ්‍යාපන දර්ශන</u>** ලෙස හැඳින්වෙයි.

1. **සන්තත වාදය (perennilism)**
2. **සාරාත්මවාදය (Essentialism)**
3. **ප්‍රගති වාදය (Progressivlism)**
4. **ප්‍රතිනිර්මාණ වාදය (Reconstructionism)**

)

# සන්තතවාදය (PERENNIALISM)

මෙය පැරණි දර්ශනවාදයේ මූලාරම්භයක් ලෙස දැක්විය හැක. ඇරිස්ටෝටල්, ප්ලේටෝ යන අයගේ දර්ශනය සමඟ බද්ධ වේ. අන්තවාදය නමැති දර්ශනවලින් ඉදිරිපත් කරන්නේ **<u>රොබට් ලෙනාර්ඩ් සහ මෝට්ටල් ඇල්ඩර්</u>** යන දාර්ශනිකයන් දෙදෙනායි. ඔවුන් මෙම දර්ශනයේ සාරය ලෙස දක්වන්නේ බටහිර ශිෂ්ටාචාරයේ ශ්‍රේෂ්ඨ අදහස් වල අවබෝධය ලබා ගැනීම හා සනාථ කර ගැනීමයි. තවදුරටත් ඔවුන් ප්‍රකාශ කරන්නේ සදාතනික අදහස් ඉගැන්වීම නිත්‍ය චිරස්ථායි න්‍යායන් සොයායාම මෙම දර්ශනයේ මූලික අරමුණුයි.

එපමණක් නොවේ මිනිසා තාර්කිකව අධ්‍යාපනයට යොමු කිරීමෙන් මිනිසා මිනිසෙක් මෙන් දියුණු කිරීමට හැකි බවයි. (සන්තත වාදීන්ට) ඔවුන්ට අනුව මනුෂ්‍ය ස්වභාවය ස්ථිර හා විශ්වවිය සත්‍ය ස්වභාවය හඳුනා ගැනීමට දාර්ශනික අදහස් වැදගත් වන බවයි. සංවාදය අරමුණ වන්නේ ද පුද්ගල තාර්කික බව දියුණු කිරීමයි. බුද්ධිය තුළින් විශ්වීය සත්‍ය එළිකිරීමට නම් පුද්ගලයා අධ්‍යාපනයට යොමු කළ යුතුය.

මෙම සන්තතවාදය තුළ පැරණි අදහස් ශතවර්ශ ගනනාවකින් ඈත දක්වන ලද අදහස් අදටත් ඒවා වලංගු වන බව පවසයි. ඔවුන් පෙන්වා දෙන පරිදි පාසල් වල පෙළපොත් වල සමකාලීන වැදගත්කමක් තිබිය යුතුය. එපමණක්ද නොව ඒවා වර්තමානයට ගැළපෙන බව, ගැටළු වලට අදාල විය යුතු බව පැහැදිලි කරයි.

සන්තතවාදීන්, අධ්‍යාපනයේ ඉහළම මූලධර්මය ලෙස බුද්ධිමතුන් බිහි කිරීම අපේක්ෂා කරයි. එසේම ඔවුන් කියා සිටින්නේ ගැඹුරු අදහස් වල යෙදී අධ්‍යාපනය කරන විට බුද්ධිය

හා අධ්‍යාපනය අතර අන්තර් සම්බන්ධයක් ගොඩනැගෙන බවයි. සමස්තයක් ලෙස සන්තතවාදීන් සංස්කෘතික සාක්ෂරතාවය දැනුම ලබා දීම, චිරස්ථායී මූලධර්ම වල සිසුන් වර්ධනය කිරීම, සාහිත්‍ය, කලාව, නීතිය යන අංශ වල මානව වර්ධනයක් අවධාරණය කරයි. ඒ තුළින් බුද්ධිමය සංවර්ධනයක් අත්පත් කරගන්නා බව පෙන්වා දේ.

## <u>සන්තතවාදය හා විෂය මාලාව අතර සම්බන්ධය</u>

මෙම සන්තතවාදය හා විෂයමාලාව අතර සම්බන්ධතාවය සාකච්ඡා කරන විට ඒ අතර සම්බන්ධතාවයක් පවතී.එහිදී,

- විෂය මාලාව ක්‍රියාත්මක වීමේදී පොත් පරිශීලනය කිරීම තුළින් ඔවුන්ගේ ගැඹුරු තර්කාන්විත හැකියාව ලැබෙන බව ප්‍රකාශ කරයි.
- එබැවින් ගණිතය හා දර්ශනය වැනි පොත් විෂයමාලාව තුළින් ලබා දිය යුතු වේ.
- දර්ශනය හැදෑරීම අත්‍යාවශ්‍ය අංගයක් වන අතර එයට හේතුව ලෙස සිසුන්ගේ මනුශ්‍ය ස්වභාවයේ වඩාත් සැගවුණු හා ඥානාන්විත අදහස් සපයා ගැනීමට අවශ්‍ය බැවින්ය.
- එබැවින් මූලික හා ද්විතියික විෂය මාලාවල මෙම විෂයන් ඇතුළත් කිරීමට පෙළඹී ඇත.
- මෙම සන්තතවාදය තුළ වෘත්තීය හා ජීවන කුසලතා තෝරා ගැනීමට වැඩි ඉඩකඩක් ලබා දෙනු නොලැබේ. ඊට හේතුව වන්නේ තාර්කික භාවය සම්පූර්ණයෙන්ම මගහැරෙන නිසාවෙනි.
- සන්තතවාදීන්ට අනුව එකිනෙකට සම්බන්ධ නොවන විශාල ප්‍රමාණයේ තොරතුරු පිළිබඳව විශ්වාස කරයි. එබැවින් සිසුන්ට අධ්‍යාපන සංකල්ප ඉගැන්වීමේදී පැහැදිළි කිරීමේදී වැඩි කාලයක් ගුරුවරයා විසින් ගත යුතු බව කියයි.
- විශාල ප්‍රමාණයේ විද්‍යාත්මක දැනුමත් , විඥාණවාදයත්සොයා යැමට ඉගැන්විය යුතුය.
- ද්විතියික හා විශ්ව විද්‍යාල මට්ටම් වලදී වැඩි වශයෙන් ඉඩකඩක් ලබා දිය යුත්තේ අදහස් උදහස්, සංකල්ප තේරුම් ගැනීමට, <u>සංවාද හා වැඩමුලු</u> අවධාරණය කළ යුතු බවයි.
- සිසුන් තක්සේරු කිරීම නොව ඉගෙනීමට ඉගෙනගැනීම කළයුතු බව. (ඉගෙන ගන්නා දෙය තුළින් ඒවා භාවිතා කරමින් ඒ ඔස්සේ නැවතත් ඉගෙන ගැනීමට සැලැස්වීම)
- දත්ත රැස් කිරීමට වඩා විද්‍යාත්මක ක්‍රමය, විද්‍යාත්මක දැනුම, හේතු සෙවීම, ගෙනහැර දැක්වීම ආදිය විෂය මාලාවේදී කළ යුතු බව පිළිගනී.
- පාසල් වල ආගමික වටිනාකම් පිළිබඳව සාරධර්ම ඉගැනිවිය යුතු බව පෙන්වා දේ. එහිදී හරි වැරද්ද අතර වෙනස නිශ්චිතව හඳුනාගනී. (ප්‍රඥාව වැඩිවන විට තමන් තුළ බුද්ධිමත් බව, පැසුනුබව, ප්‍රඥාවන්තභාවය ඇතිවන බව. මේ තුළින් හරි වැරද්ද තේරුම් ගැනීමේ හැකියාව වර්ධනය වේ.)

# සාරාත්මවාදය (Essentialism)

සාරාත්මකවාදීන් වැඩි වශයෙන් අවධාරණය කරන්නේ සිසුන්ට ප්‍රමාණුකූලව ශික්ෂණය (උගන්වන) ලබා දිය යුතු බවයි. මෙම වාදය තුළින් අධ්‍යාපනික හා දැනුමේ සහ **<u>චරිත සංවර්ධනය මූලික හරය ලෙස අවබෝධ කරවයි.</u>** මෙය මධ්‍යස්ථ දර්ශනයක් පදනම් කරගනිමින් පාසල මගින් මූලික සමාජය නැවත හැඩගැන්වීමට සිසුන්, වඩාත් ආදර්ශවත් කිරීමට, පුරවැසියන් කිරීමට, පාරම්පරික සාරධර්ම දැනුම පාසල මගින් සම්ප්‍රේෂණය කළ යුතු බව පවසයි.

ගුරුවරුන් හා සිසුන් ගුණධර්ම අධිකාරියට යටත් කළ යුතුය. ගරු කළ යුතුය. රාජකාරිය සඳහා ඇති භක්තිය, අන් අය ගැන සිතීම ආදිය ගැන ඉගැන්විය යුතුය. විද්‍යාත්මක පර්යේෂණ තුළින් ලොව පිළිබඳව, පැවැත්ම පිළිබඳව අවබෝධය ලබා ගැනීමේ වැදගත්කම පසක් කරන ලදී. විද්‍යාත්මක නොවන දර්ශනය වන ආගමට වඩා ස්වභාවික විද්‍යාව වැඩි වශයෙන් අවධාරණය කරයි. එසේම සාරාත්මකවාදය තුළින් පාසල් ප්‍රතිපත්ති විනය, මහන්සි වී වැඩ කිරීම යන ගුණාංගයන් ඉස්මතු කර පෙන්වයි. මෙම දර්ශනය 1930 ගණන්වල බිහිවූ දර්ශනයක් වන අතර මෙහි පුරෝගාමීන් ලෙස විලියම් බැග්ලේ සහ පෝල් කොපර්මන් සහ තියෝඩර් සයිසර් යන දාර්ශනිකයන්ය.

## <u>සාරාත්මවාදය හා විෂය මාලාව අතර සම්බන්ධය</u>

- මෙම සාරාත්මකවාදී දර්ශනය තුළ විෂයමාලාවේදී අධ්‍යාපනික දැනුම සහ චරිත සංවර්ධනය මූලික හරය ලෙස අවබෝධ කරවයි.
- එබැවින් සාරාත්මකවාදීන් හර විෂයමාලාවක් ඉගැන්විය යුතු බව අවධාරණය කරයි.
- විෂය මාලා ඉගැන්වීමේදී සරලබවේ සිට සංකීර්ණ බව දක්වා යා යුතු බව පැහැදිළි කරයි.
- ඉගැන්වීම ගුරු කේන්ද්‍රීය වේ. එසේම සිසුන්ටද සංස්කෘතික සාක්ෂරතාවය (සංස්කෘතීන් හඳුනා ගැනීම) ලබා දිය යුතුය.
- දැනුම අවබෝධය ලබා දීම තුළින් සිසුන් සැබෑ ලෝකයේ වැඩදායී පුද්ගලයන් ලෙස සකස්කළ යුතුය.
- පාසලේ ඉගෙනුම් පරිසරය තුළ විනය (යහගුණ) එකතු කළයුතුය.
- ගුරුවරයා පූර්ණකාලීනව අධ්‍යාපනය ලබා දීමට සකස් වී තිබිය යුතුය. (පාසලෙන් හා පාසලෙන් පරිබාහිරවද)

# ප්‍රගතිවාදය (Progressivism)

මෙම දාර්ශනික විශ්වාසයට අනුව මිනිසා ස්වභාවයෙන්ම සමාජශීලි හා අන්අය සමග සැබෑ ජීවන ක්‍රියාකාරකම් තුළින් ඉගෙන ගන්නා බව කියයි. මෙම ප්‍රගතිවාදය තුළින් සිසුන්ගේ කැමැත්ත, රුචිය හඳුනාගනිමින් විෂය කරුණු, විෂයන් ක්‍රියාකාරකම් සූදානම් කිරීම මගින් වඩාත් හොඳ පුද්ගලයන් බිහිවන බව පැහැදිළි කරයි. ප්‍රගතිවාදීන් පෙන්වන්නේ සමාජයේ අනුකම්පාව සම්ප්‍රේෂණය කිරීම මගින් අධ්‍යාපනයේ කාර්යය පහසු කරන බවයි. ප්‍රගතිවාදීන් පෙන්වා දෙන අන්දමට හුදකලාව අධ්‍යාපනය ලැබීම මනස ක්‍රියාකාරකම් වලින් ඈත් කර තැබීමක් බව කියයි. එබැවින් සිසුන් අන්අය සමග එක්ව වැඩ කිරීමට උගතගත යුතුය.

ඔවුන්ට අනුව යම් හැකියාවක්, කුසලතාවයක් ලබාගත හැක්කේ කණ්ඩායමක් තුළින් පමණක් බව පැහැදිළි කරයි. එපමණක්ද නොව එක්ව කටයුතු කිරීම අලුත් අදහස් මතුකර ගැනීමට අවස්ථාවක් කරගත හැක. ප්‍රගතිවාදීන් පෙන්වා දෙන්නේ අන්තර් සම්බන්ධතාවය තුළින් ජාතීන්, සමාජ පන්තිය, කුලය වැනි කෘතීම භාදකයන් මගහරවා ගැනීමට හැකි බවයි. අධ්‍යාපනය යනු සිසුන් විද්‍යාඥයින් සේ ඉගෙන ගත යුතු බවත් එය ක්‍රියාව තුළින් අවධාරණය කළයුතු බවත් පෙන්වා දෙයි. සිසුන් සැබෑ ජීවන සිදුවීම් හා සමග සම්බන්ධව කළයුතු අතර  පරිසරයට සම්බන්ධ ක්‍රියාකාරකම් පරිහරණය කිරීමට ඉඩ ලබා දිය යුතු බව ප්‍රගතිවාදීන්ගේ අදහයි.

<u>ප්‍රගතිවාදය හා විෂය මාලාව අතර සම්බන්ධය</u>

- මෙමගින් සමාජ විද්‍යාව සහ ස්වභාවික විද්‍යාව ගැන අවධාරණය කරයි. ගුරුවරයා විසින් සමාජ සංවර්ධනය සිසුන්ට හඳුන්වා දිය යුතුය. සිසුන්ගේ පෞද්ගලික අත්දැකීම් පුලුල් කිරීම සඳහා වර්තමාන සමාජ අත්දැකීම්, අධ්‍යාපනය සමග සම්බන්ධ කළ යුතුය.
- විෂයමාලාව මගින් සිසුන්ගේ අත්දැකීම් හා ක්‍රියාකාරකම් කැමැත්ත මත ගොඩනගන ලද පාඨමාලා කේන්ද්‍ර කරගත යුතුය. (මුල්කරගත යුතුය)
- සිසුන්ට ඉහළ චින්තනයක් හා දැනුමක් ගොඩනැංවිය හැකි ආකාරයේ විෂය මාලා ඉදිරිපත් කළ යුතුය, පාඩම් සැලසුම් සකස් කළ යුතුය.
- සිසුන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය දිරිමත් කළ යුතුය.
- සිසුන්ට ගුරුවරුන් විසින් විවිධ විෂය සංකලනයෙන් යුත් පාඩම් ලබා දිය යුතුය.
- සිසුන්ට මේවා ඉගැන්වීමේදී වඩාත් නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී විෂය මාලාවක් නිරාවරණය කළ යුතුය.
- ජීවිතයේ අධ්‍යාපනික අත්දැකීම් සපුරා ගැනීම සඳහා පාසල, වැඩපල (වැඩබිම), ප්‍රජාව මිශ්‍ර කරගත යුතුය (සම්බන්ධ කරගත යුතුය).

# ප්‍රතිනිර්මාණවාදය (Reconstructionism)

මොවුන්ගේ වාදය අනුව ප්‍රති සමාජ සංවර්ධනයට කැමැත්ත පල කරයි. සිසුන්ට යම් වෙනසක් ගෙනආ යුත්තේ කෙසේද, ඉගැන්විය යුත්තේ කෙසේද යන්න වාද කරයි. එබැවින් ප්‍රතිනිර්මාණවාදීන් සමාජය නැවත ගොඩනැංවීම සහ සංස්කෘතික මූලික පහසුකම් පිළිබඳව විශ්වාසය පල කරයි. සිසුන් සමාජ ගැටලු අධ්‍යයනය කළ යුතු බව පවසයි.ඔවුන් ප්‍රකාශ කරන්නේ නව සමාජ වැඩපිළිවෙළක් මගින් මිනිසුන් සූදානම් කිරීම සුදුසු බවයි.

ප්‍රතිනිර්මාණවාදය පිළිබඳව මුලින්ම අදහස් දක්වන්නේ **<u>තියෝඩර් බර්මිල්ඩ්</u>** නැමැති දාර්ශනිකයයි. ඔහු ප්‍රකාශ කරන්නේ පීඩනයෙන් මිදී මානව තත්වය (මිනිසුන් අතර සම්බන්ධතා, සහයෝගීතා) වැඩිදියුණු කිරීම මගින් සමාජ ප්‍රතිනිර්මාණය සිදුකළ හැකි බවයි. ඒ අනුව සමාජය පදනම් කරගත් ඉගෙනීම, ලෝකය පන්ති කාමරයට සම්බන්ධ කිරීම වැනි උපාය මාර්ග වඩාත් සුදුසු බව ඔවුහු අවධාරණය කළේය.

## <u>ප්‍රතිනිර්මාණවාදය හා විෂය මාලාව අතර සම්බන්ධතාවය</u>

- සිසුන් සමාජ ගැටලු සඳහා සමාජයේ වෙනසක් ඇති කිරීම සඳහා කැපවිය යුතුය.
- විෂය මාලාව සමාජ ආර්ථික ගැටලු මෙන්ම සමාජ සේවාද මුල් කරගෙන සම්පාදනය කළ යුතුය.
- දේශීය, අන්තර් ජාතික සමාජය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් සඳහා සිසුන් නිරත විය යුතුය.
- සමාජ අසාධාරණය, සමාජ අසමානතාවය, සමාජ අසාධාරණයට එරෙහිව සිසුන්ගේ අදහස් යොමු කළ යුතුය.
- සමාජ වෙනසක් කිරීමට උර දෙන විෂය මාලා නිරන්තරයෙන්ම වෙනස් විය යුතුය.
- අන්‍යෝන්‍ය අවබෝධය වැඩි කිරීම, විශ්වාසවන්තබව, එකමුතුව වැනි කරුණු විෂය මාලාවේ අරමුණු කළ යුතුය
- ගුරුවරු සමාජ වෙනසකට නියමුවෝ විය යුතුය.

<u>අභ්‍යාසය</u>

1. ප්‍රධාන අධ්‍යාපන චතුර් අධ්‍යාපන දර්ශන නම් කරන්න.
2. ඔබ ඉගෙන ගත් චතුර් අධ්‍යාපන දර්ශන 02 ක් ඇසුරින් විෂය මාලාව හා සම්බන්ධ වන ආකාරය පිළිබඳව ඔබගේ අදහස් ඇසුරෙන් කෙටියෙන් සඳහන් කරන්න.